# 2026.04.07 දින පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගිවූ ගරු මන්ත්‍රීවරුන්

1. ගරු ප්‍රාදේශීය සභා සභාපති යහලවෙල ගෙදර සංජීව කරුණාසාගර මහතා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මැණිකාමාර දූරයලාගේ මනෝ කුමාර එදිරිසිංහ මහතා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි දෙලංකාගේ නිමාලි දිල්හානි මෙනෙවිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කඩුකාර මුදියන්සේලාගේ නන්දසිරි මහතා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ චාමින්ද දසනායක මහතා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහමායාගොඩගේ විරාජ් මලින්ද ඩයස් මහතා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ ප්‍රදීප් සුජීව හේරත් මහතා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි මුතුගල නිශාන්ති ගුණතිලක මහත්මිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පනම්බර මුදියන්සේලාගේ කුමාරසේන ජයලත් මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අගාරේ ගෙදර දූරයාලගේ රංජිත් ප්‍රේමලාල් මහතා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි නිමල්කා කොටඹගේ මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්පටිදේවගේ ලාලිත ඉඳුනිල් මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුරුප්පු මුදියන්සේලාගේ අජිත් තිලකසිරි මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේන්ද්‍ර ගල්අද්දලාගේ අජිත් ලක්ෂ්මන් මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අකුරන් පේඩි දූරයලාගේ ඉෂාන් මධුශංක පීරිස් මහතා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසේ හේවගේ මාලක අරුණ කුමාර මහතා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එදිරිසිංහ ආරච්චිලාගේ ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රහ්මචාරිගේ සුදත් උදය කුමාර මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි සේනානායක මුදියන්සේලාගේ සජිනා සුරංගි මහත්මිය
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයසිංහ මුදියන්සේලාගේ දිලිප් ජයසිංහ මහතා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රත්නායක මුදියන්සේලාගේ උපුල් නිශාන්ත මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විස්කම් නන්දන වඩු ආචාරිගේ රංජිත් නවරත්න මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාපා අශෝක හේරත් මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රාධිපතියලාගේ රංජිත් අබේපාල මහතා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහම්මදු තාහීර් මොහමඩ් තස්ලිම් මහතා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රාජගුරු දිසානායක මුදියන්සේලාගේ ජයන්ත දිසානායක මහතා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බන්නැහැක මුදියන්සේලාගේ ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි වීරරත්න තෙන්නකෝන් මුදියන්සේලාගේ චාන්දනී දීපිකා රත්නායක මහත්මිය
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි රාජකරුණානායක මුදියන්සේලාගේ නිලන්ති විජේසිංහ මහත්මිය
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහමඩ් කබීර් රිෆාක් හුසේයින් මහතා
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දොලවත්තගේ දොන් සිරන්ත පද්මලාල් මහතා
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මල්ලව ආරච්චිලාගේ මංජුල ප්‍රසන්න මල්ලව ආරච්චි මහතා

## රැස්වීම සඳහා සහභාගි නොවූ ගරු මන්ත්‍රීවරුන්

1. ගරු ප්‍රාදේශීය සභා උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා

2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අලහකෝන් පතිරන්නැලාගේ තරංග චම්පික අලහකෝන් මහතා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඉදිරිප්පුලිගේ සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්හොට් හලුවන්නැහැලාගේ රංජිත් උපාලි මහතා

**ආගම සිහි කිරීම.**

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය කිරීමෙන් , ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූල ආරම්භ කරන ලදී. 2026 අප්‍රේල් මස මහා සභා රැස්වීමට සහභාගි වන ගරු උපසභාපති ඇතුළු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලය ,ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩල නිලධාරීන් , මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියළුදෙනාට ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා සුභ උදැසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියළුදෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

## 06 (අ). 1.පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම .

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

2026.03.10 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කරගන්නා ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

සුභ උදෑසනක් ගරු සභාපතිතුමනි, ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි.පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන ඇත්නම් ඒවාද ඇතුලත්ව සම්මත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## (ආ).සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

ජනාධිපති ලේකම් කාර්යාලයෙනුත්, පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයෙනුත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවෙනුත් ලිපි කීපයක් ඉදිරිපත් කරලා තියනවා ඉන්ධන පාරිභෝජනය සම්බන්ධයෙන් වැඩසටහන් හදන්නත් විශේෂ චක්‍රලේඛයක් නිකුත් කරලා තියනවා ප්‍රාදේශීය සභාවන් වෙත. මං එය ඉදිරිපත් කරන්නම්.

### අභ්‍යන්තර චක්‍රලේඛ 02/2026

**බලශක්තිය අරපිරිමැස්මෙන් භාවිත කිරීම.**

පවතින වියළි කාලගුණය හමුවේ බලශක්තිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම අප සියළු දෙනාගේ වගකීම බව පසක්කරමින් අත්‍යවශ්‍ය සේවා බාධාවකින් තොරව පවත්වාගෙන යෑම තහවුරු කරනු පිණිස අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් විසින් CGES/2026 හා 2026.03.23 දිනැති ලිපිය අනුව දක්වා ඇති මාර්ගෝපදේශ වලට අදාලව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ පෙරපාසල්, පුස්තකාල, ආදාහනාගාරය, සියඹලාස්වැටිය වැව පරිශ්‍රය, ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය, ගබඩාව, රියදුරු කාමරය, ප්‍රජා ශාලාව සඳහා මෙම අභ්‍යන්තර චක්‍රලේඛයේ සඳහන් පහත කරුණු අනුගමනය කරන ලෙස දන්වමි.

ස්වභාවික ආලෝකය හා වාතාශ්‍රය ලැබෙන පරිදි ප්‍රධාන කාර්යාලයේ හා අනෙකුත් සෑම ස්ථානයකම දොර ජනෙල් විවෘත කර තැබීම.

රාජකාරි ස්ථානයෙන් පිටව යන සෑම අවස්ථාවක දීම විදුලි බල්බ හා විදුලි පංකා ක්‍රියා විරහිත කිරීම.

රාජකාරි කටයුත්තක් නොමැති සෑම විටම පරිගණක යන්ත්‍ර ක්‍රියාවිරහිත කර තබා ගැනීම.

මුද්‍රණ යන්ත්‍ර සියල්ල ක්‍රියාත්මක කරනවා වෙනුවට එක මුද්‍රණ යන්ත්‍රයක් පමණක් ක්‍රියාත්මක කර භාවිතයට ගැනීම.
රාත්‍රී කාලයේ දී කාර්යාලයේ හා අදාළ ස්ථානවල අත්‍යාවශ්‍ය ස්ථානවල පමණක් විදුලි බල්බ දැල්වීම.
තේ පානය කරන සියලු දෙනා එකවර වතුර උණුකර ගැනීමට කටයුතු කිරීම.
භෝජනාගාර කාමරයේ ආහාර ගැනීමෙන් පසු විදුලි බල්බ හා විදුලි පංකා ක්‍රියාවිරහිත කිරීමට කටයුතු කිරීම.
වැසිකිළි භාවිතා කිරීමෙන් පසු වැසිකිළියේ ඇති විදුලි බල්බ නිවා දැමීමට කටයුතු කිරීම.
රාජකාරි වෙලාවෙන් පසුව හා සතිඅන්ත දිනවල රාජකාරිවල නියැලෙන නිලධාරීන් සිටින සීමාවේ දී පමණක් විදුලි බල්බ හා විදුලි පංකා ක්‍රියාත්මක කිරීම.
කාර්යාලයට අමතරව තම නිවසේ බලශක්තිය ඉතිරිවන ලෙස කටයුතු කිරීම.
ඒ වගේම විශේෂයෙන් දැනුම් දෙන්න ඕන විදුලි පහන් දැල්වීමේදී ප.ව 6-10 ත් අතර වීදි පහන් නිවා දමා රාත්‍රි 10 න් පසුව වීදි පහන් ආලෝකකරණය කරන්න කියලා අපිට දැනුම් දීලා තියනවා.එතකොට වීදි පහන් ආලෝකකරණය කරන්න කියලා අපිට දැනුම් දීලා තියෙනවා.එතකොට වීදි පහන් අපි දන්නවා දැන් සමහර වෙලාවට දවල්ටත් වීදි පහන් දැල්වෙමින් පවතිනවා.ඒ නිසා කොට්ඨාශවල ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා ජනතාව දැනුවත් කරලා විදුලිය අරපිරිමැස්මෙන් පාවිච්චි කරන්න.විශේෂයෙන් යුදමය තත්වය කවදා නිමාවෙයිද කියලා අපිට කියන්න බෑ.අපි තවම ලංකාවේ තෙල් ලිං හාරලා නෑ. කලින් හාරනවා කිව්වා නමුත් හාරලා නෑ තෙල් ළිං.ඒ නිසා අපිට තෙල් අර්බුදය ජනතාවට ප්‍රශ්නයක් නොවන විදිහට, සාමාන්‍ය ජන ජීවිතය පවත්වාගෙන යැම සඳහා ප්‍රශ්නයක් නොකරගෙන ඉදිරියට ගෙන යැමේ කළමණාකාරීත්වය ඇති කරගන්න ඕන.ඒ නිසා ඉල්ලීමක් කරනවා.

## (ඇ).ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන.

## 1.නිවාඩු අනුමත කිරීම.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

ඒ යටතේ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී අයි. සද්නා දිල්හානි මන්ත්‍රිතුමිය අද දිනේ නිවාඩු ඉල්ලලා ලිපියක් යොමු කරලා තියනවා.ඒ වගේම රංජිත් උපාලි ගරු මන්ත්‍රිතුමා නිවාඩු ඉල්ලලා ලිපියක් ඉදිරිපත් කරලා තියනවා, ඒ වගේම ගරු උප සභාපතිතුමා බන්දුල සමරවික්‍රම මහතා අද දිනේ අසනීප හේතුවෙන් නිවාඩු ඉල්ලලා ලිපියක් ඉදිරිපත් කරලා තියනවා. ඒ වගේම තරංග චම්පික මන්ත්‍රීතුමා නිවාඩු ඉල්ලලා තියෙනවා. එතුමන්ලගෙ නිවාඩු අනුමත කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමාගෙන් අවසරයි.ඒ වගේම ලේකම්තුමියගෙනුත් ගෞරවනීය මන්ත්‍රි මණ්ඩලයෙනුත් අවසරයි.ගරු සභාපතිතුමනි, අද දින නිවාඩු ඉල්ලලා ඇති ගරු මන්ත්‍රීවරුන්හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රීනී ට්.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය- (ජා.ජ.බ)</u>

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා හා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකොන් මහතා සහ ගරු මන්ත්‍රීනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය සහ ගරු මන්ත්‍රී ආර්.එච්. රංජිත් උපාලි මහතා වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණ සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**II.2026.03.06** වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ **නිවාඩු අනුමත කිරීම.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

2026.03.06 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රී ජේ.එම්.දිලිප් ජයසිංහ මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී එම්.ටී.එම්.තස්ලිම් මහතා ,ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් දොලවත්ත මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමනි, 2026.03.06 දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා

**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි.එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.03.06 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රී ජේ.එම්.දිලිප් ජයසිංහ මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී එම්.ටී.එම්.තස්ලිම් මහතා ,ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් දොලවත්ත මහතා වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**III.2026.03.06 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

2026.03.06 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රී ජේ.එම්.දිලිප් ජයසිංහ මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී එම්.ටී.එම්.තස්ලිම් මහතා ,ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් දොලවත්ත මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

2026.03.06 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා

**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.03.06 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රී ජේ.එම්.දිලිප් ජයසිංහ මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී එම්.ටී.එම්.තස්ලිම් මහතා ,ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් දොලවත්ත මහතා වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**IV.2026.02.26 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

2026.02.26 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රී එස්.එච්.මාලක අරුණ කුමාර මහතා, ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා ,ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, ගරු මන්ත්‍රීනී බී. එම්.ශ්‍රියානී මානෙල් බන්නැහැක මහත්මිය, ගරු

මන්ත්‍රිනී ඩී නිමාලි දිල්හානි මහත්මිය, ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් දොලවත්ත මහතා ,ගරු මන්ත්‍රී සී.පී.රංජිත් අබේපාල මහතා, ගරු මන්ත්‍රී පී.එම් කුමාරසේන ජයලත් මහතා , වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී ආර්.එම්. උපුල් නිශාන්ත මහතා - (ජා.ජ.බ)</u>

2026.02.26 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් සඳහා නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා

<u>ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා-(ස.ජ.බ.)</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.02.26 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රී එස්.එච්.මාලක අරුණ කුමාර මහතා, ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා ,ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, ගරු මන්ත්‍රිනී බී. එම්.ශ්‍රියානී මානෙල් බන්නැහැක මහත්මිය, ගරු මන්ත්‍රිනී ඩී නිමාලි දිල්හානි මහත්මිය, ගරු මන්ත්‍රී ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් දොලවත්ත මහතා,ගරු මන්ත්‍රී සී.පී.රංජිත් අබේපාල මහතා, ගරු මන්ත්‍රී පී.එම් කුමාරසේන ජයලත් මහතා , වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

## (ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -නැත

## (ඉ) යථා පරිදි කල්දී ඇති යෝජනා

### (ඉ) I. <u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). I දරණ යෝජනාව</u>

ම විසින් ඉදිරිපත් කරන 6.(ඉ). I යෝජනාව. අංක 03/2024 හා 2024.12.31 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් යොමු කිරීම සම්පූර්ණයෙන්ම මාර්ගගත හා තොරතුරු තාක්ෂණ පද්ධතියක් යටතේ SLIP ක්‍රමය යටතේ සිදු කළ යුතු බව දන්වා ඇති බැවින් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ වැටුප් හා රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් වාරික ගෙවීම් සිදුකිරීම සඳහා SLIP පහසුකම ලබා ගැනීම සුදුසු බව යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රිනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය- (ජා.ජ.බ)</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව අංක 03/2024 හා 2024.12.31 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් යොමු කිරීම සම්පූර්ණයෙන්ම මාර්ගගත හා තොරතුරු තාක්ෂණ පද්ධතියක් යටතේ SLIP ක්‍රමය යටතේ සිදු කළ යුතු බව දන්වා ඇති බැවින් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ වැටුප් හා රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් වාරික ගෙවීම් සිදුකිරීම සඳහා SLIP පහසුකම ලබා ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

### (ඉ) II. <u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u> <u>විසින් කරනු ලබන අංක 6.(ඉ). II දරණ යෝජනාව</u>

ම විසින් ඉදිරිපත් කරන 6.(ඉ).II යෝජනාව. ඇසළ පොහොයට සමගාමීව රාජ්‍ය ආයතන ඒකාබද්ධ බැති ගී වැඩසටහන සඳහා 607-01-V111වැය ශීර්ෂය යටතේ රු.200,000.00ක්ද 607-03-1Vවැය ශීර්ෂය යටතේ රු.100,000.00 ක් ද ලෙස ඉහත වැඩසටහන ඉටු කිරීමට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු300,000.00ක් වැය දැරීමට යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී එම්. අශෝක හේරත් මහතා -(ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

අපි හැම අවුරුද්දකම මෙම වැඩසටහන පවත්වගෙන යනවා.ගිය සැරේ බැති ගී වැඩසටහන පැවැත්වුයේ දහම් පාසල් දරුවන් සඳහා.මේ සැරේ රාජ්‍ය ආයතන වල නිලධාරීන් සඳහා මේ බැතී ගී වැඩසටහන පවත්වනවා. ගිය සැරෙත් සාර්ථකව මේ වැඩ සටහන පැවැත්වූවා. මෙවරත් මේ බැති ගී වැඩසටහන සාර්ථකව පැවැත් වීම සඳහා යෝජනාව සම්මත කර ගමු.

**ඒ අනුව ඇසළ පොහොයට සමගාමීව රාජ්‍ය ආයතන ඒකාබද්ධ බැති ගී වැඩසටහන සඳහා 607-01-V111වැය ශීර්ෂය යටතේ රු.200,000.00ක්ද 607-03-1Vවැය ශීර්ෂය යටතේ රු.100,000.00 ක් ද ලෙස ඉහත වැඩසටහන ඉටු කිරීමට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු300,000.00ක් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**III. <u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). III දරණ යෝජනාව</u>**

ම විසින් ඉදිරිපත් කරන 6.(ඉ).III යෝජනාව. කෝන්වැව, වැව ඉහළ, මංඩපොළ පදිංචි එම්.ඩබ්.පද්මා මාලනී මහත්මියගේ පිලිකා රෝගය වෙනුවෙන් රු.10,000.00 ක ආධාර මුදලක් ලබා දීමට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඔ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් වැය දැරීමට යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. අජිත් තිලකසිරි මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව කෝන්වැව, වැව ඉහළ, මංඩපොළ පදිංචි එම්.ඩබ්.පද්මා මාලනී මහත්මියගේ පිලිකා රෝගය වෙනුවෙන් රු.10,000.00 ක ආධාර මුදලක් ලබා දීමට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඔ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**IV. <u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). IV දරණ යෝජනාව</u>**

පඩුවස්නුවර ප්‍රාදේශිය සභාව සතු ගැසට් නොවු මාර්ග නැවත වතාවක් ගැසට් කිරීම සුදුසු බව යෝජනා කරමි.

**ගැසට් කිරීමට ඉදිරිපත් වී ඇති මාර්ග ලැයිස්තුව**

| මාර්ගයේ නම | වසම |
|---|---|
| රිට්ටාදෙණිය සමීර ලී මෝල අසලින් ආරම්භ වන දකුණු දිශාවට දිවෙන මාර්ගයේ ඉතිරි කොටස | දහනැක්ගෙදර |
| අංගමුව කනත්ත පාරේ පවරාගෙන නොමැති කොටස | මඟුලාගම |
| නිකපිටිය ප්‍රධාන මාර්ගයේ හෙට්ටිපොල සිට පැමිණෙන විට දෙවැනි පාලම පසුවූවාත් සමඟ ඇති අතුරු මාර්ගය | සුනන්දපුර |
| මඟුලාගම කණිෂ්ඨ විද්‍යාලය අසල සිට හේනේගෙදර මාර්ගයේ කි.මී.භාගයක් පමණ ගිය විට දකුණු පසට දිවෙන මාර්ගය | මඟුලාගම |
| කටුමුළුව දිවුල්පොත ඉඩම දක්වා ඇති මාර්ගය | කොළඹගම |
| උඩගම ශ්‍රී බෝධිරාජාරාමය මහ පන්සල අසල සර්විස් සෙන්ටර් අසල සිට උඩගම කේ.පී.ඩී.ගුණතිලක යන අයගේ නිවස දක්වා ඇති මීටර් 200 ක් පමණ මාර්ගය | කෙවිටිය |
| පල්ලේගම ආචිරියාකොටුව වැව හරහා ගලේගෙදර සිරිසේන මහතාගේ නිවස දක්වා දිවෙන මාර්ගය | පල්ලේගම |
| මොරගනේ වදුරුස්සහේන කන්ද මාර්ගය (මීටර් 750 පමණ) (මොරගනේ මහ විදුහල ඉදිරිපිට මාර්ගයට ගොස් දකුණට හැරෙන මාර්ගය) | කනෝගම |

| | |
|---|---|
| නෙලිබැව වරාය ඉහලවෙල දක්වා මාර්ගය (මීටර් 700 ක් පමණ) | කනෝගම |
| නෙලිබැව පංසල් ක්‍රීඩා පිටිය අසල ගොඩ ඇස්සැද්දුමට ප්‍රවේශ මාර්ගය ( මීටර් 300ක් පමණ) | කනෝගම |
| නෙලිබැව ගමේ වෙලට ප්‍රවේශ මාර්ගය (කි.මී.1 පමණ) | කනෝගම |
| රඹෑව අවිස්සාවේල්ල වත්ත මැද පාර | සුනන්දපුර |

**ගරු මන්ත්‍රී එම්.ඒ.මංජුල ප්‍රසන්න මංජුල මල්ලව ආරච්චි මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

මේ අනුව සභාවට දිනෙන් දිනම සභාව සතු නොවූ මාර්ග ගැසට් කරන්න කියලා ඉල්ලීම් කරලා තියනවා.සාමාන්‍යයෙන් මේවා අවුරුද්දකට වතාවක් ආණ්ඩුකාරතුමා විසින් ගැසට් කරනවා. අපිට ලැබිලා තියන මාර්ග වලින් දැනට මෙන්න මේ මාර්ග ගැසට් කරන්න යෝජනාව සම්මත කරගමු.ආයේ අලුතින් ආවොත් ඒකට ඇතුලත් කරමු.

**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. සියළුම සහෝදර මන්ත්‍රීතුමන්ලා තුමියන්ලාගෙන් අවසරයි.ඒ වගේම ලේකම්තුමිය ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සියළුදෙනාගෙන් අවසරයි.ගරු සභාපතිතුමනි මේ පාරවල් සභාවට අනුමත කර ගත්තට ගැටළුවක් නෑ.සභාවට අනුමත කරගන්න ඕන.හැබැයි පහුගිය දියීවා සුළි කුණාටුවෙන් ආපු සල්ලි වලින් මේ පාරවල් හදලා තියනවද නැද්ද කියන එක අපි දන්නෙ නෑ.පැහැදිලිවම ඒවට බොරළු දාලා සකස් කරලා තියනවනම් හැබැයි අද මේ ඔබතුමා කියන මාර්ග ඒ මුදල්වලින් වියදම් කරලා හදලා තියනවනම් අපි විරුද්ධයි.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා**

ගරු මන්ත්‍රීතුමා මේවා මේ මිනිස්සු ඉල්ලපු පාරවල්.එහෙම බොරළු දාපු පාරවල් මෙතන තියනවනම් පෙන්වන්න කරුණා කරලා.

**ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. සියළුම සහෝදර මන්ත්‍රීතුමන්ලා තුමියන්ලාගෙන් අවසරයි.ඒ වගේම ලේකම්තුමිය ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සියළුදෙනාගෙන් අවසරයි.ගරු සභාපතිතුමනි මං හිතන්නෙ මේ පාරවල් සාමාන්‍යයෙන් ආසනේ පුරාම ඇති පාරවල් සභාවට තමයි අයිති. කරත්ත පාර වුනත් සභාවට තමයි අයිති. දැන් මේ පාරවල් අපි ප්‍රාදේශීය සභාව තුල හිටපු කාල සීමාව තුල ලොකු ගැටළුවලට මුහුණ දීලා තියනවා මෝටර් ග්‍රේඩරය අරන් ගිහිල්ලා පාරක් කපන්න ගියාම. කරත්ත පාරවලුත් අපිට කපලා දෙන්න කියලා ඉල්ලීම් කරනවා.එතකොට මෝටර්ග්‍රේඩරය අරන් ගිහිල්ලා සමහර වෙලාවට ඒ මෝටර් ග්‍රේඩරයේ තියන බේල්ඩ් ටික ඒ පාර ඇතුලෙ හරවන්නවත් බෑ.එතකොට සභාවෙන් කළ යුතු දෙයක් තියනවා නේද?. මේ පාරවල් මැනුම් කටයුත්තක් කරලා හරි සභාවට අයිතිය පවරගන්නවනම් අඩි 12 ක හෝ අඩි 10 ක හෝ ප්‍රමාණයක් ඉල්ලාගෙන මේ පාරවල් සභාවට ඇති තරමට ලබා දෙන්න නැත්තම් ඔය ඉඩම් හිමියො ඔය පාරවල් ගැසට් කරාට පස්සෙ ඕවගේ මෝටර්ග්‍රේඩරයක්වත් යන්න දෙන්නෙ නෑ.අඩුතරමෙ බෝක්කුවක අවශ්‍යතාවයක් ආවාම වුනත් බෝක්කුව දාන්න දෙන්නෙ නෑ.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

ගරු මන්ත්‍රීතුමා පාරවල් සභාවට පවරගන්න ක්‍රමයක් තියනවා.ඒ ක්‍රමවේදය තමයි ප්‍රදේශයේ ජනතාව අපේ පාර සභාවට පවරගන්න කියලා ඉල්ලීමක් ජනතාවගේ අත්සනින් ලබා දුන්නට පස්සෙ අපේ තාක්ෂණ නිලධාරීන් ගිහිල්ලා ඔබතුමා ඔය කියන විදිහෙ සභා මාර්ගයකට අවශ්‍ය කරන දුර ප්‍රමාණය හා පළල තියනවද, සභා මාර්ගයක් ලෙස මෙය ගැසට් කරගන්න පුළුවන්ද කියලා නිර්ණායක බලලා තමයි අපි ගැසට් එකට ආණ්ඩුකාරතුමාගෙ අනුමැතියට යවන්නෙ.එතකොට එහෙම තෝරගත්ත පාරවල් ටිකක් තමයි මේ තියෙන්නෙ.අද දවසෙත් මම දැක්කා මෙසෙ උඩ ලියුම් 3 ක් හෝ 4 ක් පාරවල් සභාවට පවරගන්න කියලා.එතකොට ජනතාවගෙ ඉල්ලීම් මේ තියෙන්නෙ.

**ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)**

ඔබතුමා ඔය කියන විදිහට පාරවල් දෙපස ඉන්න අයට දැනුම් දීලා දැනුවත් කරලද තියෙන්නෙ.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**
දෙපස ඉන්න අය අපි දැනුවත් කරලා නෙමේ මන්ත්‍රීතුමා.ඒ ජනතාවගෙ ඉල්ලීම් මේ තියෙන්නෙ.

**ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)**
ගැසට් කරනකොට සාමාන්‍යයෙන් එහෙම වැඩසටහන් සභාව මඟින් කරන්නෙ නැද්ද?

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**
සභාවෙන් කරනවා මන්ත්‍රීතුමා. සභාවෙන් කරන්නෙ ජනතාවගෙ ඉල්ලීමක් එක්ක.තියන හැම පාරක්ම ගිහිල්ලා සභාවට පවරගන්න යන්නෙ නෑ.නමුත් එහෙම වැඩ පිලිවෙලක් අපිට හදන්න පුළුවන්.හැබැයි දැන් තියන කිලෝමීටර් එක්දාස් පන්සීයෙනුත් මේ වෙනකොට හදලා තියෙන්නෙ කිලෝමීටර් දෙසීයටත් වඩා අඩු ප්‍රමාණයක්. මේ අවුරුදු තිස්ගානට. ඒ නිසා සභාවට පවරගන්නවා වගේම නඩත්තු කරන්නත් ඕන.මන්ත්‍රීතුමා මේ තියෙන්නෙ ජනතා ඉල්ලීම.

**ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)**
ඒක තමා අපි අහන්නෙ.ජනතා ඉල්ලීම අනුව ගැසට් කරන්නෙ අර ක්‍රමවේදයට අනුවද?

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**
මන්ත්‍රීතුමා දෙවනි වතාවටත් කියන්නම්. මහජනතාව ඉල්ලුවට පස්සෙ තාක්ෂණ නිලධාරී ගිහිල්ලා අදාල කටයුතු කරලා මේ ගැසට් පත්‍රයට යොමු කරලා තියනවා.

**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**
දිදීවා සුලි කුණාටුවට ආපු මුදල් වලින් වියදම් කරලා හදලා තියනවනම් ඒ පාරවල් ගැසට් කරනවට විරුද්ධයි කියන එක වාර්තා කරන්න.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**
අපි අභියෝග කරනවා.එහෙම පාරවල් තියනවනම් පෙන්වන්න කියලා.

**ඒ අනුව පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව සතු ගැසට් නොවූ මාර්ග නැවත වතාවක් ගැසට් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**V. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).Vදරණ යෝජනාව**
ම විසින් ඉදිරිපත් කරන 6.(ඉ).Vයෝජනාව. අංගමුව සායන මධ්‍යස්ථානය ගොඩනැගිල්ල පඬුවස්නුවර නැගෙනහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සඳහා මාසික කුලී පදනමින් බදු ලබා දීමට කෙටුම්පත් කළ ගිවිසුම හා එහි සංශෝධන සහිතව ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් එවා ඇති සංශෝධිත ගිවිසුම පිළිගැනීමේ යෝජනාව

**ගරු මන්ත්‍රී බී. සුදත් උදය කුමාර මහතා- (ජා.ජ.බ)**
ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**
පඬුවස්නුවර නැගෙනහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය අපේ ගොඩනැගිල්ලේ ස්ථාපිත කරා මාර්තු මාසෙ ඉඳලා. ඒ ගොල්ලන්ට හදිස්සියෙන්ම හිටපු ගොඩනැගිල්ලෙන් ඉවත් වෙන්න වුනා.ඇත්තටම එළියට දැම්මා වගේ වැඩක් තමා කලේ.පුද්ගලික ගොඩනැගිල්ලක හිටියෙ.ඒ නිසා අපි සම්මත කරගත්ත පරිදි අපේ ගොඩනැගිල්ලට ගෙනාවා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පවත්වාගෙන යන්න ඕන නිසා.මාර්තු මාසෙ ඉඳලා පදිංචි වෙලා ඉන්නවා.සාමාන්‍යයෙන් ඒ ගොල්ලො මුදල් ගෙවන්න ඕනිනෙ.අපේ ගිවිසුමට අනුව දඩ මුදලක් අය වෙන්න ඕන.නමුත් ඒක නැතිව මාර්තු, අප්‍රේල් මාස වලට කුලිය පමණක් අය කරගන්න අනුමත කරගමු.

**ඒ අනුව අංගමුව සායන මධ්‍යස්ථානය ගොඩනැගිල්ල පඬුවස්නුවර නැගෙනහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සඳහා මාසික කුලී පදනමින් බදු ලබා දීමට කෙටුම්පත් කළ ගිවිසුම පිළිගැනීමත් මාර්තු, අප්‍රේල් මාස සඳහා දඩ මුදල් නොමැතිව මාසික කුළිය පමණක් අය ගැනීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**VI.**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).VIදරණ යෝජනාව</u>
මීළඟට පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ භාණ්ඩ භාර ගැනීමේ කමිටුව සඳහා පහත නම් සඳහන් තනතුරු දරන නිලධාරීන්ගෙන් යුත් කමිටුවක් පත් කිරීම සුදුසු බව යෝජනා කරමි.
ඒ.එම්.එස්.එම්.විජේසිංහ මහතා - කමිටු සභාපති (තාක්ෂණ නිලධාරී)
එච්.එම්.ඩී.එච්.මැණිකේ මහත්මිය -කමිටු සාමාජික (ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරී)
එම්.ඩබ්.අජන්තා කුමාරි මහත්මිය - කමිටු සාමාජික (ප්‍රජා සංවර්ධන නිලධාරී)
**<u>ගරු මන්ත්‍රිනී ඊ.ජී. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය- (ජා.ජ.බ)</u>**
ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ භාණ්ඩ භාර ගැනීම සඳහා කමිටුවක් පත් කර ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(ඊ). කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.**

**(ඊ). I. 2026.03.06 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**(ඊ). II. 2026.03.06 දින පැවති ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**(ඊ). III.2026 පෙබරවාරි මස අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම**

**(ඊ). IV. ජාතික විගණන කාර්යාලය විසින් එවන ලද ආදායම් කාර්ය සාධන විගණන වාර්තාව (2025 වර්ෂය) සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**(උ) ලැබීම් හා වියදම් පිලිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම පිලිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම**

**(උ) I. <u>2026 පෙබරවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.</u>**
**උපලේඛන 01 සඳහා අනිත් පිට බලන්න**

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

ප්‍රා.ස-14

### මාසික ඒකාබද්ධ වැය සාරාංශය - 2026 පෙබරවාරි

| අය විෂය අංකය | වැය විෂය නාමයන් | 1 පොදු පරිපාලනය | 2 සෞඛ්‍ය සේවා | 3 භෞතික සැලසුම් මංමාවත් ඉඩම් | 4 ජල සේවා | 5 වනත් උපයෝගි සේවා | 6 සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 3228118.57 | 1378092.60 | 1777837.10 | 80126.45 | 210228.90 | 4635103.28 | 11309506.90 |
| 2 | ගමන් වියදම් | 113595.00 | 0.00 | 0.00 | 0.00 | 18370.00 | 0.00 | 131965.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 102331.00 | 250056.00 | 89280.00 | 0.00 | 0.00 | 44590.00 | 486257.00 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු | 15000.00 | 70640.00 | 666731.99 | 1850.00 | 0.00 | 0.00 | 754221.99 |
| 5 | ප්‍රවාහන, සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 99011.69 | 15261.75 | 0.00 | 11901.54 | 32636.92 | 14625.90 | 173437.80 |
| 6 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 12500.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 12500.00 |
| 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 0.00 | 25156.06 | 0.00 | 0.00 | 0.00 | 3870.97 | 29027.03 |
| | **පුනරාවර්ථන වැය එකතුව** | **3570556.26** | **1739206.41** | **2533849.09** | **93877.99** | **261235.82** | **4698190.15** | **12896915.72** |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| 9 | ප්‍රාග්ධන වැය | 9765.00 | 0.00 | 0.00 | 84051.28 | 0.00 | 0.00 | 93816.28 |
| 10 | ණය ආපසු ගෙවීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **9765.00** | **0.00** | **0.00** | **84051.28** | **0.00** | **0.00** | **93816.28** |
| | **පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධක වැය එකතු** | **3580321.26** | **1739206.41** | **2533849.09** | **177929.27** | **261235.82** | **4698190.15** | **12990732.00** |
| | තැන්පත් | 669758.55 | | | | | | 669758.55 |
| | වැට් | 0.00 | | | | | | 0.00 |
| | ජාතිය ගොඩනැගීමෙ බද්ද | 0.00 | | | | | | 0.00 |
| | මුද්දර බද්ද | 0.00 | | | | | | 0.00 |
| | සේවක ණය | 799950.00 | | | | | | 799950.00 |
| | අත්තිකාරම් | 34290.00 | | | | | | 34290.00 |
| | ණයහිමි | 18049831.25 | | | | | | 18049831.25 |
| | සමුච්චිත අරමුදල | 0.00 | | | | | | 0.00 |
| | ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| | අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| | මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| | වෙනත් | 0.00 | | | | | | 0.00 |
| | **මුළු එකතුව** | **19553829.80** | | | | | | **32544561.80** |

**(උ) II. 2026 පෙබරවාරි ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 02 සඳහා අනිත් පිට බලන්න**

පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව | ප්‍රා.ස-16

මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය 2026 පෙබරවාරි

| අය විෂය නාමයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත්/ඉඩම් හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 10 වරිපනම් හා බදු | 173299.51 | 407000.00 | 0.00 | - | - | 0.00 | 580299.51 |
| 20 කුලී | | - | 1138700.00 | - | 2172235.00 | 62050.00 | 3372985.00 |
| 30 බලපත්‍ර ගාස්තු | 0.00 | 242722.14 | - | - | - | 7845.00 | 250567.14 |
| 40 සේවා සදහා ගාස්තු | 0.00 | 402600.00 | 174193.25 | 17412.50 | - | 1490.00 | 595695.75 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | 0.00 | 0.00 | 10700.00 | 0.00 | 1195.00 | 926.00 | 12821.00 |
| 60 වෙනත් ආදායම් | 93088.52 | 172070.00 | 0.00 | 59372.00 | 0.00 | 0.00 | 324530.52 |
| 70වෙනත් ආධාර | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **266388.03** | **1224392.14** | **1323593.25** | **76784.50** | **2173430.00** | **72311.00** | **5136898.92** |
| **ප්‍රාග්ධන ආධාර** | | | | | | | |
| 80 මූලධන ලැබීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පුනරාවර්තන ආදායම් හා ප්‍රාග්ධන ආදායම්වල එකතුව** | **266388.03** | **1224392.14** | **1323593.25** | **76784.50** | **2173430.00** | **72311.00** | **5136898.92** |
| තැන්පත් | 1017006.75 | | | | | | 1017006.75 |
| වැට් | 0.00 | | | | | | 0.00 |
| ජා.ගො.බද්ද | 0.00 | | | | | | 0.00 |
| මුද්දර බදු | 28491.00 | | | | | | 28491.00 |
| සේවක ණය | 833970.00 | | | | | | 833970.00 |
| අත්තිකාරම් | 0.00 | | | | | | 0.00 |
| ණය ගැති | 10262512.72 | | | | | | 10262512.72 |
| සමු: අරමුදල | 0.00 | | | | | | 0.00 |
| ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| ශීර්ෂ බැර | 51234.54 | | | | | | 51234.54 |
| **මුළු එකතුව** | **12193215.01** | | | | | | **17330113.93** |

**(උ) I11. 2026 පෙබරවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 03 සඳහා අනිත් පිට බලන්න**

| පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව | | | | | ප්‍රා.ස. 07 වාර්තාව - 2026 වර්ෂය | | | | මාසය:-පෙබරවාරි | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | අය විෂය | මාසය මුලදී හිඟය 1 | මාසය මුලදී ඉදිරියට ලැබීම් 2 | මාසය තුළ බිල් කිරීම් 3 | ලැබිය යුතු මුළු ආදායම 4 | මාසය තුළ ලද ආදායම 5 | මාසයට අදාල කලින් ලැබූ ආදායම 6 | ඉදිරියට ගෙන යන කලින් ලැබූ ආදායම 7 | මාසය තුළ ලද ආදායමින් ඉදිරියට ලැබූ ආදායම 8 | මාසය තුළ ලද ආදායමින් අය වූ හිඟය 9 | ඉදිරියට ගෙන යන හිඟය 10 | ඉදිරියට ලැබීම් 11 |
| | | | | | (1+3) | | | ( 2-6) | | | 4 - (5+6)+8 | (7+8) |
| 1 | වරිපනම් බදු 1/11 | 0.00 | 151,509.87 | 0.00 | 0.00 | 172,939.51 | 0.00 | 151,509.87 | 0.00 | 0.00 | 0.00 | 151,509.87 |
| 2 | අක්කර බදු 1/12 | 0.00 | 17,952.60 | 0.00 | 0.00 | 360.00 | 0.00 | 17,952.60 | 0.00 | 0.00 | 0.00 | 17,952.60 |
| 3 | කඩ කුලී 3/22 | 327,250.00 | 23,000.00 | 1,122,400.00 | 1,449,650.00 | 1,083,400.00 | 13,000.00 | 10,000.00 | 24,250.00 | 0.00 | 377,500.00 | 34,250.00 |
| 4 | වත්කම් බදු 5/23 | 1,094,995.00 | 5,675.00 | 1,548,124.50 | 2,643,119.50 | 1,118,245.00 | 2,837.50 | 2,837.50 | 31,840.00 | 0.00 | 1,553,877.00 | 34,677.50 |
| 5 | ජල ගාස්තු 4/62 | 31,744.00 | 13,191.00 | 44,308.00 | 76,052.00 | 46,887.00 | 4,461.00 | 8,730.00 | 6,938.00 | 0.00 | 31,642.00 | 15,668.00 |
| 6 | ව්‍යාපාර බදු 2/16/2 | 0.00 | 0.00 | 393,000.00 | 393,000.00 | 393,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | කර්මාන්ත බදු 2/16/1 | 0.00 | 0.00 | 11,000.00 | 11,000.00 | 11,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 8 | ඇතම් ව්‍යාපාර බදු 2/16/3 | 0.00 | 0.00 | 3,000.00 | 3,000.00 | 3,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | වෙළඳ බලපත්‍ර 2/31 | 0.00 | 0.00 | 172,722.14 | 172,722.14 | 172,722.14 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | විශේෂ බලපත්‍ර ගාස්තු2/31 -II | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | එකතුව | **1,453,989.00** | **211,328.47** | **3,294,554.64** | **4,748,543.64** | **3,001,553.65** | **20,298.50** | **191,029.97** | **63,028.00** | **0.00** | **1,963,019.00** | **254,057.97** |

**(උ) IV.  2026 අප්‍රේල් මාසික ආදායම් පුරෝකථන වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න**

**මාසික අදායම් පුරෝකථන වාර්තාව - පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව**

**මාසය :- 2026 අප්‍රේල්**

| අනු අකය | ආදායම් ශීර්ෂය | වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව 2026 | | | මාසික ආදායම් පුරෝකථනය | | | අය වී ඇති ආදායම 2026 පෙබරවාරි | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අය - වැය ලේඛනය අනුව (1) | පරිපූරක මඟින් (2) | එකතුව3(1+2) | පෙර මාසය දක්වා (4) | මාසය තුළ(5) | එකතුව6(4+5) | පෙර මාසය දක්වා (7) | මාසය තුළ (8) | එකතුව 9 (7+8) |
| 1 | වරිපණම් ( 1/11) | 4,700,000.00 | 0.00 | 4,700,000.00 | 3,600,000.00 | 162,500.00 | 3,762,500.00 | 2,185,686.91 | 172,939.51 | 2,358,626.42 |
| 2 | අක්කර බදු ( 1/12 ) | 30,000.00 | 0.00 | 30,000.00 | 3,000.00 | 2,000.00 | 5,000.00 | 1,185.00 | 360.00 | 1,545.00 |
| 3 | කසල බදු(2/13) | 30,000.00 | 0.00 | 30,000.00 | 5,000.00 | 2,500.00 | 7,500.00 | 0.00 | 0.00 | 0.00 |
| 4 | කර්මාන්ත බදු(2/16/ii) | 60,000.00 | 0.00 | 60,000.00 | 15,000.00 | 5,000.00 | 20,000.00 | 14,000.00 | 11,000.00 | 25,000.00 |
| 5 | ඇතැම් ව්‍යාපාර බදු(2/16/x) | 3,000.00 | 0.00 | 3,000.00 | 3,000.00 | 0.00 | 3,000.00 | 3,000.00 | 3,000.00 | 6,000.00 |
| 6 | ව්‍යාපාර බදු ( 2/16/i ) | 1,500,000.00 | 0.00 | 1,500,000.00 | 1,025,000.00 | 100,000.00 | 1,125,000.00 | 479,400.00 | 393,000.00 | 872,400.00 |
| 7 | බලපත්‍ර ගාස්තු ( 2/31/i) | 1,400,000.00 | 0.00 | 1,400,000.00 | 700,000.00 | 200,000.00 | 900,000.00 | 159,862.16 | 172,722.14 | 332,584.30 |
| 8 | විශේෂ බල:ගාස්තු(2/31/x) | 320,000.00 | 0.00 | 320,000.00 | 0.00 | 5,000.00 | 5,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | කඩ කුලී ( 3/22 ) | 12,192,000.00 | 0.00 | 12,192,000.00 | 3,048,000.00 | 1,016,000.00 | 4,064,000.00 | 925,500.00 | 1,083,400.00 | 2,008,900.00 |
| 10 | ජංගම අලෙවි කුටි ( 3/22-i) | 303,600.00 | 0.00 | 303,600.00 | 75,900.00 | 25,300.00 | 101,200.00 | 52,800.00 | 46,200.00 | 99,000.00 |
| 11 | පූජාභූමි වෙළඳ කුටි(3/22-ii) | 720,000.00 | 0.00 | 720,000.00 | 180,000.00 | 60,000.00 | 240,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 12 | ත්‍රි රෝද රථ නැවතුම් ගාස්තුව (03/43Xv) | 150,000.00 | 0.00 | 150,000.00 | 37,500.00 | 12,500.00 | 50,000.00 | 8,400.00 | 7,200.00 | 15,600.00 |
| 13 | ජල ගාස්තු(4/62/i,i) | 680,000.00 | 0.00 | 680,000.00 | 158,751.00 | 52,917.00 | 211,668.00 | 29,525.00 | 46,887.00 | 76,412.00 |
| 14 | සතිපොල බදු (5/22/i/iii/iV ) | 11,400,000.00 | 0.00 | 11,400,000.00 | 2,850,000.00 | 950,000.00 | 3,800,000.00 | 855,700.00 | 1,053,990.00 | 1,909,690.00 |
| 15 | බදු කුලී ( 5/23 ) | 20,000,000.00 | 0.00 | 20,000,000.00 | 4,336,000.00 | 1,958,000.00 | 6,294,000.00 | 604,272.50 | 1,118,245.00 | 1,722,517.50 |
| 16 | සතිපොල බහු.කාර්.ගොඩ 5/25/1/ii | 50,000.00 | 0.00 | 50,000.00 | 10,000.00 | 10,000.00 | 20,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 17 | විනෝද බදු ( 6/15 ) | 750,000.00 | 0.00 | 750,000.00 | 187,500.00 | 62,500.00 | 250,000.00 | 58,000.00 | 0.00 | 58,000.00 |
| 18 | ප්‍රජා ශාලා/ක්‍රීඩා පි(6/25/ii/v) | 100,000.00 | 0.00 | 100,000.00 | 30,000.00 | 20,000.00 | 50,000.00 | 28,000.00 | 28,000.00 | 56,000.00 |
| | **එකතුව** | **54,388,600.00** | **0.00** | **54,388,600.00** | **16,264,651.00** | **4,644,217.00** | **20,908,868.00** | **5,405,331.57** | **4,136,943.65** | 9,542,275.22 |

**(උ) V.  2026 පෙබරවාරි මාසික වියදම් පුරෝකථන වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න**

## <u>මාසික වියදම් පුරෝකථන වාර්තාව - 2026 පෙබරවාරි</u>

| අනු අංකය | වැය ශීර්ෂය | වාර්ෂික වියදම් ඇස්තමේන්තුව | | | වියදම් පුරෝකථනය | | | වැය කල මුදල | | | අතිරික්තය/ ඌනතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අයවැය ලේඛනය | වැය ශීර්ෂ මාරු කිරීම / පරිපූරක | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | |
| 1 | වැටුප් දීමනා | 155,557,000.00 | - | 155,557,000.00 | 12,957,000.00 | 12,950,000.00 | 25,907,000.00 | 10,008,689.24 | 11,309,506.90 | 21,318,196.14 | 4,588,803.86 |
| 2 | ගමන් වියදම් | 935,000.00 | - | 935,000.00 | 5,000.00 | 100,000.00 | 105,000.00 | 5,600.00 | 131,965.00 | 137,565.00 | (32,565.00) |
| 3 | සැපයුම් හා උපකරණ | 18,846,500.00 | - | 18,846,500.00 | 850,000.00 | 1,000,000.00 | 1,850,000.00 | 333,272.00 | 486,257.00 | 819,529.00 | 1,030,471.00 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අළුත් වැඩියාව හා නඩත්තුව | 26,306,000.00 | - | 26,306,000.00 | 20,000.00 | 40,000.00 | 60,000.00 | 202,009.00 | 754,221.99 | 956,230.99 | (896,230.99) |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 7,587,000.00 | - | 7,587,000.00 | 400,000.00 | 300,000.00 | 700,000.00 | 28,349.00 | 173,437.80 | 201,786.80 | 498,213.20 |
| 6 | පොලී ගෙවීම් , ලාභාංශ සහ ප්‍රසාද මුදල් | - | - | - | - | - | - | - | - | - | - |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 8,681,000.00 | - | 8,681,000.00 | 100,000.00 | 300,000.00 | 400,000.00 | 26,042.81 | 12,500.00 | 38,542.81 | 361,457.19 |
| 8 | විශ්‍රාම වැටුප් ,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 532,500.00 | - | 532,500.00 | 44,375.00 | 44,375.00 | 88,750.00 | - | 29,027.03 | 29,027.03 | 59,722.97 |
| 9 | උපකරණ වැය | 52,025,000.00 | - | 52,025,000.00 | 1,000,000.00 | 1,500,000.00 | 2,500,000.00 | - | 93,816.28 | 93,816.28 | 2,406,183.72 |
| 10 | ණය ආපසු ගෙවීම් | - | - | - | - | - | - | - | - | - | - |
| | එකතුව | 270,470,000.00 | - | 270,470,000.00 | 15,376,375.00 | 16,234,375.00 | 31,610,750.00 | 10,603,962.05 | 12,990,732.00 | 23,594,694.05 | 8,016,055.95 |

**(උ). රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට - නැත.**

අද අප්‍රේල් මාසෙ 7 වෙනිදා. තව දින කීපයකින් සිංහල හා දමිළ අලුත් අවුරුද්ද උදා වෙනවා.ඔබ සියළු දෙනාට සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමින් න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත්,සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තුතිය පිරිනමන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
පෙ.ව.10.40 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

2026.04.07 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව ගරු සභාවේ එදින පැමිනි සිටි සභිකයන් විසින් සභා සම්මත කරන ලදි

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

2026.01.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී ජේ.එම්. දිලිප් ජයසිංහ මහතා - (ජා.ජ.බ)</u>**

2026.01.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.